# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2113/67 - 2019 මාර්තු මස 08 වැනි සිකුරාදා - 2019.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) වැනි ව්‍යවස්ථාවට හා 46(1) (අ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක : 2103/33 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව, වරින් වර සංශෝධනය කරන ලද නිවේදනය, 2019 මාර්තු මස 07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 මාර්තු මස 06 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

උපලේඛනය

(1) එම නිවේදනයෙහි අංක (1) ''ආරක්ෂක අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වන තීරුවෙහි 21 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

22. වර්ධනය වන තරඟකාරී වෙළඳපොළ තුළ, පොදු යහපත සුරකිමින් අභියෝග සඳහා ප්‍රතිචාර දැක්වීම මගින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා විදුලි සංදේශ කටයුතු නියාමනය කිරීම

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 22 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි 21 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

22. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

(ඇ) එහි III වැනි තීරුවෙහි දක්වෙන ''ජාතික පොලිස් අභ්‍යාස ආයතනය පනත (2011 අංක 44)'' ට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

1A - G 29614 — 382 (2019/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

● ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)

(2) එම නිවේදනයෙහි අංක (6) ''මුදල් අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි 40 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

41. සීමාසහිත ශ්‍රී ලන්කන් එයාර් ලයින් සහ එහි පාලිත සමාගම්

(3) එම නිවේදනයෙහි අංක (20) ''නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි II වැනි තීරුවෙහි 26 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

27. මහින්ද රාජපක්ෂ ජාතික ටෙලි - සිනමා උද්‍යානය (රන්මිහිතැන්න)

(4) එම නිවේදනයෙහි අංක (28) ''විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍ය'' ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි 2 වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

3. නවීන තාක්ෂණය යොදා ගනිමින් සැමට විදුලි සංදේශ පහසුකම් ලබා දීමට අවශ්‍ය පියවර ගැනීම

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 3 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි I වැනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

2. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන

(ඇ) එහි II වැනි තීරුවෙහි අයිතම 2 සිට නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන ''ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත (2013 අංක 33) '' ට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

● ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)

03 - 1169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.